C
373
JAY

# " ඉගෙනීමේ පසුබටතාවය කෙරෙහි බලපාන සමාජ ආර්ථික කරුණු"

( ගම්පහ අධ්‍යාපන මංඩලය ඇසුරින් කෙරෙන සමීක්ෂණයකි )

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය අධ්‍යාපන විද්‍යා අංශය මගින් පවත්වන අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අර්ධ පූර්ණයක් වශයෙන් ඉදිරිපත්කෙරෙන පර්යේෂණ නිබන්ධනය 1981/1982

මාබෙල් ජයසුන්දර,
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.

උපදේශක කථිකාචාර්යවරු:

1. ආචාර්ය එම්.යූ.සේදර
2. ආචාරිනී එස්. විජේතුංග.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

400615

## සංක්ෂිප්තය

ඉගෙනීමේ පසුබටභාවය කෙරෙහි බලපාන සමාජ ආර්ථික කරුණු පිළිබඳව කරනු ලබන මෙම විමර්ශණය ගම්පහ අධ්‍යාපන මංඩලයේ පාසැල් දහයක සිසුන් දහසක් අතරින් සිසුන් එකසිය පණහක් නියැදිය වශයෙන් තෝරාගෙන කරන ලද්දකි. මෙම සමීක්ෂණයට භාජනයවී ඇත්තේ 8 වැනි ශ්‍රේණියේ සිසුන්ය. පසුබටභාවය නිර්ණය කිරීම සඳහා පොදු සාධන පරීක්ෂණයකින් ලබාගත් ලකුණු උපයෝගීකොට ගෙන ඇත. මව් බස, ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය යන ප්‍රධාන විෂයයන් හතරෙන් ඒ ඒ විෂයයේ මධ්‍යනයෙන් සම්මත අප ගමන එකක් අඩු කිරීමෙන් පසු ලැබෙන ලකුණු මට්ටමට වඩා අඩු ලකුණු ලැබීම පසුබට බව වශයෙන් සලකා ඇත. මෙහිදී විෂයයන් හතරෙන්ම මෙසේ අඩු ලකුණු ලැබූ සිසුන් එකසිය පණහක් සමීක්ෂණයට භාජනය වේ.

ඉගෙනීමේ පසුබටභාවය කෙරෙහි බලපාන සමාජ ආර්ථික කරුණු විමසීමට සිසුන් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කර ඇත. එම කරුණු තව දුරටත් විශ්ලේෂණය කිරීම සඳහා සිසුන්ගේ දෙමාපියන් සඳහා ප්‍රශ්නාවලියක්ද සිසුන් සඳහා බුද්ධි පරීක්ෂණයක්ද ඉදිරිපත්කොට ඇත.

පසුබට සිසුන් පිළිබඳව කරුණු රැස්කිරීමේදී පසුබට ලමයා අයත් පවුල සම්බන්ධ සාධක, ලමයා හා බැඳි සාධක හා පාසැලට අදාල සාධක ඔස්සේ කරුණු රැස්කර ඇත.

පර්යේෂණ අවධානය ප්‍රායෝගික සීමාවන් සලකා යොමු කිරීමේදී කල්පිත දොලහක් ඔස්සේ දත්ත විශ්ලේෂණයකොට ඇත.

පියාගේ රැකියාවර්ගය, දෙමාපිය අධ්‍යාපන මට්ටම, පවුලේ ආදායම් මට්ටම, අධ්‍යාපනය පිළිබඳව දෙමාපිය ආකල්ප, දරුවා මව්පියන් සමග එකම නිවසක ජීවත්වීම, පවු ලේ විශාලත්වය, පියා මත්පැන් පානය කිරීම, ළමයාගේ සෞඛ්‍ය තත්වය, ළමයාගේ අනාගත වෘත්තීය අපේක්ෂාව, නිවසේදී දරුවාට හිමිවන භෞතික පහසුකම්, ශිෂ්‍යයා පාසැලෙන් පසු කාලයගතකරන ආකාරය හා ගුරු දෙගුරු සමිතිවලට දෙමාපිය සහභාගීත්වය යන කරුණු අධ්‍යාපන පසුබටතාවයට බලපොපායි යන සුවිශේෂ කල්පිත 12 අනුව කරුණු විශ්ලේෂණය කිරීමට සංඛ්‍යාත්මක වෙශෙෂියා සූත්‍රය ආධාරකරගෙන ඇත.

මෙම කල්පිතයන් අනුව එළඹි නිගමනය වූයේ දෙමාපිය අපේක්ෂාව හැරුණු විට අනෙකුත් සාධක සියල්ලම දැඩි ලෙස අධ්‍යාපන පසුබට තාවයට බලපාන බවය. ඒ අනුව මෙහිදී පීරණයකල හැක්කේ සමාජ ආර්ථික කරුණු ඉගෙනීමේ පසුබටතාවය කෙරෙහි බලපාන බවය.